# කොවිඩ් 19 සති පාසල

## සබරගමුව

## ගණිතය පළමු වාරය 9 ශ්‍රේණිය අප්‍රේල් 4 සතිය

1. සංඛ්‍යා රටාවක සාධාරණ පදය 8n+1 වේ.එම රටාවේ 165 පදයක් නොවන බව පෙන්වන්න.

2. රු560 ක් ලෙස මිල සලකුණු කර ඇති ඔරලෝසුවක් 532 ට විකුණයි.මෙහිදි ලබා දුන් වට්ටම හා වට්ටම් ප්‍රතිශතය සොයන්න.

3. එක්තරා සබන් වර්‍ගයක අලෙවි නියොජිතයෙකුට ඔහු අළෙවි කල සබන්වල වටිනාකමින් 5% ක් කොමිස් හිමිවේ.රු 38 350 ක් කොමිස් ලෙස ලැබුණු මාසයක අළෙවි කල සබන් වල වටිනාකම සොයන්න.

4. ඉඩමක් විකිණීමෙදි තැරවුකරුවෙකු 3% ක කොමිස් අය කරයි.රු 820 000කට ඉඩමක් විකිණීමෙන් තැරවුකරුට ලැබෙන මුදල සොයන්න.

5. 1010 දෙක,10 පාදයට හරවන්න

6. 63දහය ද්විමය සංඛ්‍යාවක් ලෙස ලියන්න

7. 1110 දෙක -101 දෙක අගය සොයන්න

8. (5-y)(y-7) ද්විපද ප්‍රකාශන 2 හි ගුණිත ප්‍රසාරණය කර සුළු කරන්න.

9. $a^2+a-12$ සාධක සොයන්න

10. $\frac{1}{3}$ න් $\frac{6}{7}$ සුළු කරන්න

11. $\left(\frac{1}{3}+\frac{1}{2}\right)$න් $\frac{4}{5}$ සුළු කරන්න

12. 4(a+b)+3(2a-b) ප්‍රසාරණය කර සුළු කරන්න

13. a=-2 ,b=3 නම් $\frac{a}{3}-\frac{b}{3}$ හි අගය සොයන්න.


14. 6(x-1)+3x-3 සාධක සොයන්න.

15. සමචතුරස්‍ර හැඩති පතුලක් සහිත ඝනකාභ හැඩති භාජනයක ,පතුලෙ වර්ගඵලය 225 $cm^2$ වේ.එහි ජලය 3.6 l(ලීටර්) පුරවා තිබේ.ජල මට්ටමේ උස සොයන්න.


16. දිනකට එක් පුද්ගලයෙකුට අවම වශයෙන් ජලය 150 l (ලීටර්) අවශ්‍ය වේ.ඇතුළත දිග 1.5 m,පළල 1m හා උස 1m ප්‍රමාණයේ ඝනකාභ හැඩති ටැංකියක් ජලයෙන් පිරී තිබේ නම් ,එම ජල ප්‍රමාණය පුද්ගලයින් උපරිම කී දෙනෙකුට දිනකට ප්‍රමාණවත්ද?

17. බද්ධ කෝණ යනු මොනවද?

18. a,b,c,d හි අගය සොයන්න



19.a සිට g දක්වා ඇති කෝණ වල අගයන් සොයන්න.




20. මිනිසෙකුගෙ මාසික වැටුපෙන් $\frac{7}{8}$ ක් රු 28 000 ක් වේ නම් ඔහුගේ මාසික වැටුප සොයන්න.

සැකසුම:ගීතා පෙරේරා

ර/නිවි/කලල් ඇල්ල මහ විද්‍යාලය